**අපි වෙනුවෙන් අපි අරමුදල - 2025**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනත සහ 2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෞද්ගලික දුරකථන සමාගම් සමඟ එකඟවූ ගිවිසුම් අනුව යම් මාසයකට අදාළ කුලී ආදායම ඊළඟ මාසය තුළ අරමුදල වෙත ගෙවියයුතු වුවත් මාස දෙකක් ඉක්ම වූ කාළ පමාවක් සහිතව සෑම මාසයකටම අදාළ ගෙවීම් සිදුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,506,908 ක මුදලක් ලැබිය යුතුව පැවති බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුවට අදාලව හිඟහිටි කුළුණු ආදායම් මේවනවිට මෙම අරමුදල වෙත ලැබෙමින් පවතින බව සහ ඒ අනුව ලිපි මගින් තවදුරටත් ලැබිය යුතු රු.3,464,174 ක හිඟහිටි කුළුණු ආදායම අයකර ගැනීම සඳහා සියළුම සමාගම් දැනුවත් කර ඇති බව. | පෞද්ගලික දුරකථන සමාගම් සමඟ එකඟවූ ගිවිසුම් ප්‍රකාරව මාසයක් තුළ කුළුණු ආදායම් අයකර ගැනීමටත්, ඒ සඳහා ඵලදායි අධීක්ෂන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනත 9 වගන්තිය | "අපි වෙනුවෙන් අපි අරමුදල" යන නාමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදලක් පවත්වාගෙන යා යුතු අතර, එකී පනතේ 7 වන වගන්තිය යටතේ අරමුදලට ගෙවිය යුතු මුදල් එකී ගිණුමට බැර කළ යුතු වුවද, අරමුදල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ එවැනි ගිණුමක් පවත්වාගෙන නොතිබුණි. ඒ වෙනුවට, රාජ්‍ය බැංකු 02 ක ගිණුම් 04 ක් හා පොද්ගලික බැංකුවක ගිණුම් 02 ක් ලෙස ගිණුම් 06 ක් පවත්වාගෙන තිබුණි. | නව මහ බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා ඉදිරියේදි පැවැත්වීමට නියමිත කළමනාකරණ මණ්ඩල රැස්වීම වෙත මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලබන බව | පනතේ 09 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදලක් පවත්වා ගැනීමටත්, පනතේ 07 වගන්තිය ප්‍රකාරව අරමුදලට ලැබිය යුතු මුදල් එම ගිණුමට බැර කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධිත පනත් | 2024 ජූනි 07 දිනැති දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්ගේ ලිපිය මගින් අරමුදල, උපයනු ලබන මුදල් ප්‍රමාණ රඳවා ගැනීමේ බද්ද ද ඇතුළුව ආදායම් බද්දට යටත් වන බව දැනුම් දී | ඉදිරියේදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බදු ගෙවීම සඳහා ලියාංපදිංචි වී | දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු කටයුතු සඳහා ලියාංපදිංචි වී අදාළ බදු වගකීම නිසි පරිදි හඳුනාගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | | තිබුණද, දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු කාර්යයන් සඳහා ලියාපදිංචි වීම හා අදාළ බදු වාර්තා ඉදිරිපත් කිරීම සිදු කර නොතිබුණි. | බදු ගෙවීමට කටයුතු කරනු ලබන බව | ගෙවීමටත්, නියමිත කාලසීමාවන් තුළ අදාළ බදු වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(1)(ඇ) | ඉදිරි වර්ෂයේ අයවැය ලේඛණය අරමුදලේ අරමුණට අනුව පිළියෙල කර පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය ඉදිරිපත් කිරීම 2024 නොවැම්බර් 06 දක්වා ප්‍රමාද කර තිබූ අතර පාලක මණ්ඩලයේ අනුමැතියද රහිතව ඉදිරිපත් කර තිබුණි. | 2023 මැයි 30 සිට 2024 දෙසැම්බර් 16 දින දක්වා කළමනාකරණ මණ්ඩල රැස්වීමක් නොපැවැත්වීම හේතුවෙන් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට පෙර අයවැය ලේඛනය පිළියල කර පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව භාණ්ඩාගරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2025 මාර්තු 05 දිනැති PFD/RED/REG/F&C/ 2025/ DEF දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | සන්නිවේදන කුළුණු ඉදි කිරීම සහ භාවිතා කිරීම වෙනුවෙන් ලැබී තිබූ කුලී මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, පෞද්ගලික සමාගම් 03 කින් ලැබී තිබූ රු.මිලියන 137.19 ක ආදායමක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් ලබාදෙන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලිපියක් මගින් 2026 අප්‍රේල් 28 දින ඉල්ලීමක් සිදුකරන ලද බව සහ ඉදිරියේදී එම සාකච්ඡාව මගින් ලබාදෙන උපදෙස් අනුව ක්‍රියාකරනු ලබන බව. | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව සන්නිවේදන කුළුණු ඉදි කිරීම සහ භාවිතා කිරීම සඳහා ලැබී තිබූ කුලී මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාමාන්‍ය පොලී අනුපාතයක් යටතේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ පිළිවෙලින් රු. මිලියන 2.69 සිට රු. මිලියන 23.33 දක්වා පරාසයක | සෑම මාසයක් අවසානයේදීම ඊළඟ මාසය තුල ඉදිරියට ගෙවීමට ඇති වියදම් සහ අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය | අරමුදලේ දෛනික හා කෙටිකාලීන මුදල් අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් පවතින අතිරික්ත මුදල් හඳුනාගෙන, |

| | | |
|---|---|---|
| මුදල් ශේෂයක් අරමුදල් කළමනාකරණ බැංකු ගිණුමෙහි පවත්වාගෙන තිබුණි. එහෙත්, එම අතිරික්ත මුදල් ඉහළ පොලී අනුපාතිකයක් යටතේ කෙටිකාලීන ආයෝජන සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | විශ්ලේෂණය කර රාජ්‍ය බැංකු තුළ කෙටි කාලීන ආයෝජන සිදුකිරීමට කටයුතු කරන බව | ඒවා ඉහළ පොලී අනුපාතිකයක් යටතේ කෙටිකාලීන ආයෝජනය සඳහා යොදවා අරමුදලට උපරිම ආදායමක් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.339,152,298 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.119,816,332 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.219,335,966 ක වර්ධනයක් නිරීක්ෂණය විය. අරමුදල මඟින් ක්‍රියාත්මක කරනු ලබන පූර්ණ සහ අර්ධ නිවාස ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ මුදල් වැය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අරමුදලෙහි වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවීම සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රණජයපුර නිවාස සංකීර්ණයේ නිවාසලාභීන් 160 ක් විසින් සියළු වාරික මුදල් ගෙවා අවසන් බවට තොරතුරු වාර්තා ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, දෙපාර්ශවය විසින් එළඹ තිබූ ගිවිසුමේ 2 වන වගන්තිය ප්‍රකාරව වාරික ගෙවා අවසන් කළ පුද්ගලයන් වෙත නිවාසවල අයිතිය පැවරීම් සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී එම නිවාසලාභීන් වෙත අදාල පැවරීම් සිදු කිරීමට අපොහොසත්ව තිබුණි. | රණජයපුර නිවාස සංකීර්ණයේ සම්පූර්ණ වාරික මුදල් ගෙවා අවසන් කරන ලද නිවාසලාභීන්ගේ නාම ලේඛනය 2026 අප්‍රේල් 28 දිනැති ලිපිය මඟින් ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිදහස් දීමනා පත්‍ර ලබාදීමේ කටයුතු සඳහා යොමුකර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව මුදල් ගෙවා අවසාන නිවාසලාභීන් වෙත අයිතිය පැවරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව වර්ෂය තුළ අර්ධ නිවාස 300 ක් හා පූර්ණ නිවාස 20 ක් සඳහා රු.340,000,000 ක ආධාර මුදල් ගෙවා අවසන් කිරීමට සැළසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට කිසිදු නිවාසයක් සඳහා ආධාර මුදල් ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, අර්ධ හා පූර්ණ නිවාස සඳහා 2024 වර්ෂයට අදාළව රු.22,456,942 ක් සහ 2023 වර්ෂයට අදාළව රු.1,181,172 ක් තවදුරටත් ගෙවීමට පැවතුණි. | 2025 අර්ධ නිවාස/පූර්ණ නිවාස ඉල්ලුම් කරන ලද සියළු ප්‍රතිලාභීන්ට වෙනත් ත්‍රිවිධ හමුදා සුභසාධක අංශ වෙතින් නිවාස ආධාර ලබානොගත් බවට තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ප්‍රතිලාභියා වෙතින් ලබාගැනීමට කටයුතු කළ අතර, ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදීම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වූ බව. | ප්‍රතිලාභීන් තෝරා ගැනීම් හා අවශ්‍ය තහවුරු කිරීම් කඩිනමින් සිදුකර, ක්‍රියාකාරි සැලැස්ම මඟින් අපේක්ෂිත නිමවුම් මට්ටම සාක්ෂාත් කර ගැනීමටත්, පසුගිය වර්ෂ වලට අදාළව ගෙවීමට පවතින ආධාර කඩිනමින් නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආරක්ෂක හමුදා කඳවුරු පිහිටි ඉඩම් තුළ ස්ථානගත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 49 ක් අශ්‍රිතව විදුලි සංදේශ යටිතල පහසුකම් ක්‍රියාත්මක කර කළමනාකරණය කිරීම සහ එමගින් උපයන ආදායම් අරමුදල වෙත ගෙවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විසින් පෞද්ගලික දූරකථන සමාගම් 03 ක් සමග ගිවිසුම්ගතව තිබුණි. එහෙත්, එලෙස පෞද්ගලික දූරකථන සමාගම් සමඟ ගිවිසුම්වලට එළඹීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත පැවරී තිබූ නිශ්චිත අධිකාරී බලය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර, එම අධිකාරී බලය තහවුරු කරගත නොහැකි විය. | දූරකතන සමාගම් සමඟ ගිවිසුම් ගතවීමේදී ඒ සඳහා බලය පැවරෙන නිශ්චිත අධිකාරිය කුමක්ද යන්න සම්බන්ධයෙන් තාක්ෂණික අංශය වෙතින් විමසන ලද අතර අදාළ තොරතුරු සොයාගත නොහැකි බව | ගිවිසුම් වලට එළඹීමට පෙර ඒ සඳහා නිශ්චිත අධිකාරී බලය ඇති බවට තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික කායර්සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, අරමුදල ආරම්භයේ සිට 2024 වර්ෂය දක්වා වූ වාර්තා සභාගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කාර්යසාධන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අනුමැතිය වෙනුවෙන් සකස්කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය වෙත 2026 මාර්තු 12 දින ඉදිරිපත් කර ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා නියමිත කාල සීමාව තුල පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |